**ශීර්ෂය 108 - තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උක්ත චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබූACA- 2(II) ආකෘතියේ මුදල් පොතට අනුව හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් වෙන් වෙන්ව පෙන්විය යුතු වුවත් එසේ නොකර මුළු වියදම පමණක් සටහන් කර තිබුණි. | මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව වියදම් හා අමාත්‍යාංශය මගින් දැරූ වියදම් ACA-2(I) ආකෘතියේ වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී එම වරද නිවැරදි කිරීමට සටහන් කර ගත්බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම, භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යවන ලද වාර්තාවේ සඳහන් වත්කම්වල වටිනාකම සහ අමාත්‍යාංශය වෙනුවෙන් භාණ්ඩාගාරයේ පවත්වාගෙන යනු ලබන පොත් අනුව වත්කම්වල වටිනාකම අතර වෙනස්කම් පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව එම වත්කම්වල වටිනාකම් පිළිවෙලින් රු.354,590,940 ක් රු.338,636,691 ක් හා රු.1,063,772,815 ක් වී තිබුණි. | අගයන් නිවැරදි කර ගිණුම්ගත කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශයේ සඳහන් රු.354,590,940 ක වටිනාකම cigas පරිගණක දෝෂයක් නිසා තුන් ගුණයකින් වැඩිවී රු.1,063,772,815 ක් ලෙස අමාත්‍යාංශය වෙනුවෙන් භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන පොත්වල සටහන්වී ඇති බැව් අනාවරණය වී ඇත. භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර මෙම වැරදි නිවැරිදි කර ගැනීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ දී අපහරණය කරන ලද වාහන 04 ක් හා 2018 දෙසැම්බර් 06 දින ජනාධිපති කාර්යාලය වෙත භාර දුන් එක් වාහනයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව රු.25,300,000 කින් වත්කම් වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම්වල වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | එකඟවේ.2017වර්ෂයේ අපහරණය කරන ලද වත්කම් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතියි. |
| (ඇ) | අමාත්‍යාංශය සතු රු.43,000,000 ක් වටිනා Land Rover රථය ගිණුම් ගත කර නොතිබුණි. | රථයේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වීම. | cigas මඟින් එම වත්කම ගිණුම්ගතවීම මඟහැරී ඇති බැවින් එම වටිනාකම් cigas මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතියි. |
| (ඈ) | ස්ථාවර වත්කම් යටතේ රු.286,175 ක් වටිනා පාරිභෝගික භාණ්ඩ ඇතුළත් කර තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. | පාරිභෝගික භාණ්ඩ ස්ථාවර වත්කම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතින බව. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස භාණ්ඩාගාර අග්‍රිමය හා වෙනත් ලැබීම්වල එකතුව වූ රු.123,453,757 ක වටිනාකම පෙන්විය යුතු වුවත් එය රු.128,901,477 ක් ලෙස පෙන්වා තිබීම හේතුවෙන් රු.5,447,720 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස භාණ්ඩාගාර අග්‍රිමය හා වෙනත් ලැබීම්වල එකතුව පෙන්විය යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ ආකෘතිය අනුව ලැබීම් වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය කර නොතිබූ නිසා සියළුම මූල්‍ය ලැබීම් ආදායම් නොවන ලැබීම් ලෙස පෙන්වා ඇත. ඒ අනුව රු.119,258,000 ක භාණ්ඩාගාර අග්‍රිමය හා රු.4,195,757 ක වෙනත් ලැබීම් වලට අතිරේකව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුලත් රු.2,578,571 ක තැන්පතු ලැබීම් හා රු.2,869,149 ක අත්තිකාරම් ලැබීම්ද එකතු කර |

| | | | |
|---|---|---|---|
| | | | රු.128,901,477 ක සමස්ථ ලැබීම් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස සටහන් කර ඇති බව. |
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු.2,578,571 ක තැන්පත් ලැබීම් හා මුදල් වැය කිරීම් යටතේ රු.3,976,839 ක තැන්පත් ගෙවීම් පෙන්විය යුතු වුවත් එසේ පෙන්වා නොතිබුණි. | තැන්පත් ලැබීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ හා තැන්පත් ගෙවීම් එම මුදල් ප්‍රවාහයේ වැය කිරීම් යටතේ පෙන්විය යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ ආකෘතියේ තැන්පත් ලැබීම් හා තැන්පත් ගෙවීම් වෙන් වෙන් වශයෙන් සටහන් කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා නොතිබූ බැවින්, රු.2,578,571 ක තැන්පත් ලැබීම් ආදායම් නොවන ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර ඇත. එමෙන්ම රු.3,976,839 කතැන්පත් ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් යටතේ දක්වා ඇති රු.9,272,252 තුළ අන්තර්ගත කොට ඇති බව. |
| (ඇ) | මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහයන් අමාත්‍යාංශය සතුව නොමැති වුවද තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් ලෙස රු.9,272,252 ක් පෙන්වා තිබුණි. | මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් අමාත්‍යාංශය සතුව නොමැති බව සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ රු.26,477,834 ක ශුද්ධ මුදල් ප්‍රවාහයෙන් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් සඳහා වැය කරන ලද රු.16,755,582 ක වටිනාකම අඩු කල පසු මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ රු.9,722,252 ක ශුද්ධ මුදල් ප්‍රවාහය ලබාගෙන ඇත. එම ශේෂය තුළ 2018 දෙසැම්බර් 31දිනට රු.450,000 ක් පමණක්ම මුදල් වල ශුද්ධ වෙනස් වීම ලෙස පවතින බැවින් රු.9,272,252 ක වටිනාකම තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම් වල වෙනස ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ පෙන්නුම් කරන ලදී. |

| | | |
|---|---|---|
| (ඇ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ රු.3,952,593 ක අත්තිකාරම් ලැබීම් හා රු.6,378,857 ක අත්තිකාරම් ගෙවීම් පෙන්විය යුතු වුවත් එසේ පෙන්වා නොතිබුණි. | අත්තිකාරම් ලැබීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ හා අත්තිකාරම් ගෙවීම් එම මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ පෙන්විය යුතු වීම. | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් සඳහන් කිරීමට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ඉඩ ප්‍රස්ථාව සලසා නොතිබූ නිසා අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආදායම් නොවන ලැබීම් ලෙස හා තැන්පත් ගිණුම් හා අනෙකුත් ගිණුම් වල වෙනස්වීම් ලෙස මූල්‍ය ප්‍රකාශ වල සටහන් කරන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.787,308 ක් වටිනා බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන්වල ඇතුළත් කර නොතිබුණි. | බැරකම් නිවැරදිව වාර්තා කළ යුතු වීම. | එකඟ වේ. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමේදී එම කාර්යයට ආසන්න දිනයකදී අතුරු අග්‍රිම ලබා දිය යුතු වේ. එසේම මු.රෙ. 371 (5) ප්‍රකාරව කාර්යය අවසන් වී දින 10 ක් තුළ අග්‍රිමය නිරවුල් කළ යුතු වේ. එහෙත් අතුරු අග්‍රිමයක් ලබා ගැනිමෙන් පසු එම අත්තිකාරම් පියවීමට ගත කර තිබුණු කාලය අවස්ථා 11 කදී දින 21 සිට දින | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. | එකඟවේ. අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට සියලු කාර්ය මණ්ඩලයන් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩු පාඩු ඇති නොවීමට කටයුතු කරමින් පවතින බැව් දන්වමි. |

240 දක්වා පරාසයක පැවතුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) BMW වර්ගයේ මෝටර් රථයක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අළුත්වැඩියා සහ රක්ෂණ ගාස්තු ලෙස පිළිවෙලින් රු.498,394ක් හා රු.216,293 ක් ලෙස එකතුව රු.714,687 කවියදමක් දරා තිබුණද, එම වාහනය සමාලෝචිත වර්ෂය තුළදී ධාවනය කර නොතිබුණි. | අළුත්වැඩියා සිදු කිරීමේදී විධිමත් පරිදි වාහනය පරීක්ෂා කරවීම හා ඒ අනුව නිවැරදි ඇස්තමේන්තු ලබාගෙන අළුත්වැඩියා සිදුකිරීමට කටයුතු කළ යුතුවීම. | අළුත්වැඩියා කිරීමෙන් පසු තවදුරටත් ඇති දෝෂයන් අළුත්වැඩියා කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම නිසාත් 2019 ජනවාරි 23 දින ජනාධිපති කාර්යාලය වෙත භාරදී ඇත. |
| (ආ) අනතුරුවලට ලක්වීම හේතුවෙන් හා අළුත්වැඩියා කටයුතු කාර්යක්ෂමව ඉටු නොකිරීම හේතුවෙන් එක් මෝටර් රථයක් වර්ෂය තුළදී ධාවනය කර නොතිබුණ අතර එක් කැබ් රථයක් වර්ෂය තුළදී කිලෝමීටර් 259ක් පමණක් ධාවනය කර තිබුණි. | වාහන අළුත්වැඩියා කටයුතු කාර්යක්ෂමව ප්‍රමාදයකින් තොරව සිදුකිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නොවැලැක්විය හැකි හේතු මත මෙම රථයද ඌන උපයෝජිත බවත්, අළුත්වැඩියා කටයුතු සඳහා ගතවූ කාලය ආයතන කීපයක සම්බන්ධීකරණය මත සිදුවූ බැවින් පාලනය කිරීම අපහසු වූ බව බව දන්වා සිටිමි. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට මියගියඑක් නිලධාරියෙකුගෙන් හා සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර නොගත් ණය ශේෂයරු.497,037 ක් විය. මෙම ණය ශේෂ මාස 03 සිට මාස 12 ක කාල පරාසයක් තුළ හිඟව පැවතුණි. | ආයතන සංග්‍රහයේ XXIVපරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාරව අයකර නොගත් ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එකඟවේ. |
| (ආ) ටොයොටා වර්ගයේ මෝටර් රථයක් 2016 පෙබරවාරි 28 දින අනතුරට ලක්වී තිබුණ අතර ඇස්තමේන්තුගත අලාභය රු.4,183,286 ක් වී තිබුණි. මෙම අනතුර සිදුවී වසර 03කට ආසන්න කාලයක් ගතවී තිබුණද මු.රෙ. 104 (4) ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කර නොතිබුණ බැවින් අලභායට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධවවිධිවිධාන ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කිරීම, වගකිව යුතු පාර්ශව කඩිනමින් හඳුනා ගැනීම හා අළුත්වැඩියාවන් කාර්යක්ෂම ලෙස ප්‍රමාදයකින් තොරව සිදුකරවා ගැනීම යනාදී කාර්යයන් සිදුකළ යුතු වීම. | රක්ෂණ අනුමැතිය ලැබෙන තුරු අළුත්වැඩියාව සඳහා රථය යොමු කිරීම ප්‍රමාද කරනුයේ, නියෝජිත ආයතනය විසින් අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉතා සුළු හානි සිදුවී ඇති කොටස් ද සම්පූර්ණයෙන් ඉවත් කොට නැවත යෙදවීමට මිල ගණන් ඉදිරිපත් කරන නමුත්, රක්ෂණ ආයතනය අනුමැතිය ලබා දීමේදී එම කොටස් පිළිසකර කර එම කොටසම යෙදවීමට කටයුතු කරනු ලබයි. මෙසේ රක්ෂණ අනුමැතිය ලද පසු රථය අළුත්වැඩියාවට යොමු කිරීමෙන් එම අනවශ්‍ය වියදම් ඉවත් කොට රජයේ මුදල් ඉතිරි කර ගැනීම සඳහා ඒ අයුරින් කටයුතු කරනු ලබයි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව පැවති අතර තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් අරමුණු 04 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉකුත් වසරේදී ඉදිරිපත් කර තිබුණි. එම අරමුණුවලින් Bepost ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛස්ථානය දෙන බව දන්වා තිබුණද එම ව්‍යාපෘතියේ තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. එබැවින් සමාලෝචිත වර්ෂයේ ළඟාකර ගත් ඉලක්කයන් පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය. | තිරසර සංවර්ධන ඉලක්ක මැන බැලීමට පැහැදිලි දත්ත පදනමක් හඳුනාගත යුතුවීම. | දැනට ක්‍රියාත්මක වැඩසටහනේ මැන ගත හැකි ඉලක්ක දර්ශකයන් ලෙස ලියාපදිංචි කළ ව්‍යවසායිකයන් සංඛ්‍යාව සහ ලියාපදිංචි කරන ලද නිෂ්පාදන භාණ්ඩ සංඛ්‍යාව සඳහන් කල හැක. ඉදිරියේ පවතින ප්‍රතිපාදන තුල වැඩසටහන සම්බන්ධව ප්‍රචාරණයක් ලබාදීම මගින් මෙම වැඩසටහන ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 33 ක් වූ අතර එයින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී එක් තනතුරක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරී තනතුරු 2ක් භාෂා පරිවර්තක තනතුරු 2 ක්, ප්‍රවාහන නිලධාරී එක් තනතුරක් හා කැමරා ක්‍රියාකරු එක් තනතුරක් අමාත්‍යාංශය තුළවසර 04 ක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාදයකින් තොරව බඳවා ගැනීම් කළ යුතු වීම හා අනවශ්‍ය තනතුරු වේ නම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කළ යුතු වීම. | කා.සේ.සේ පුරප්පාඩුව පැවති තනතුරු 03 සඳහා 2019 මාර්තු 01 දින බඳවා ගැනීම් සිදු කර ඇත. රියදුරු පුරප්පාඩු 03 පිරවීම සඳහා මේ වන විට අයදුම් පත් කැඳවා ඇත. අනෙකුත් තනතුරු වලට නිලධාරීන් පත්කර එවන ලෙස විටින් විට අදාල පත්වීම් බලධාරියා වෙතින් ඉල්ලීම් කර ඇති අතර නිලධාරීන් දැනුවත් කර ස්ථාන මාරු මගින් පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති බව. |